www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද අපරාධකාර ටෝනි බ්ලෙයාර් විමර්ශන කොමිසම හමුවේ පෙනී සිටියි

**Tony Blair, war criminal, testifies before inquiry**

**ක්‍රිස් මාස්ඩන් විසිනි**

**2010 ජනවාරි 30**

2003 වසරේ ඉරාක යුද්ධය පිලිබඳව චිල්කොට් විමර්ෂන කොමිසම හමුවේ දුන් සාක්ෂි වලින් බ්‍රිතාන්‍යයේ හිටපු අගමැති ටෝනි බ්ලෙයාර්, යුද අපරාධකරුවෙකු බව යලි තහවුරු කරයි. එක්සත් ජනපද බුෂ් පාලන තන්ත්‍රය විසින් විස්තාරනය කරන ලද පූර්ව භංග යුද ප්‍රතිපත්තිය අනුගමනය කරමින්, නීති විරෝධී ආක්‍රමනික යුද්ධයක් සූදානම් කිරීම සඳහා ඔහුගේ සහභාගිත්වය එම සාක්ෂියෙන් පැහැදිලි වෙයි.

සදාම් හුසේන් සතුව ජනඝාතක අවි නොතිබුන බව හොඳින්ම දැන සිටිය දී පවා, ඉරාක පාලන තන්ත්‍රයේ වෙනසක් කල යුතුවූ බවට තමන් තුල පැවති විශ්වාසය ඔහු විවෘතවම ඇඟවුම් කලේය. යුද්ධය සඳහා වූ සිය අධිෂ්ඨානය යුක්තිසහගත කිරීමේ දී ඔහුගේ අත්මීය ප්‍රකාශය, ඔහුට විරුද්ධ බරපතල ම චෝදනාව ද ගැබ්කර ගනියි.

"මෙය, බොරුවක් හෝ කුමන්ත්‍රනයක් හෝ කපටිකමක් හෝ මුලා කිරීමක් නොව නිශ්චිත තීන්දුවක්" යයි ඔහු ප්‍රකාශ කලේය. "සදාම්ගේ ඉතිහාසය, ඔහුගේ රසායනික අවි භාවිතය, ඔහු ඝාතනය කල මිලියනයකට අධික මිනිසුන්, වසර 10 ක් තිස්සේ එක්සත් ජාතීන්ගේ සම්මුති උල්ලංඝනය කිරීම යන සියලු කරුනු සැලකිල්ලට ගත් කල එලඹිය යුතු නිගමනය වූයේ, මේ පුද්ගලයා සිය අවි වැඩ පිලිවෙල ප්‍රතිසංස්ථාපනය කිරීමේ අවදානම ගැන දැන දැනත් එයට ඉඩ හැරිය හැකි ද නොඑසේ නම් එම අවදානම නොතකා හැරීම වගකීමක් සහිත ක්‍රියාවක් ද යන්නය. අවංකවම කිව හොත්, මා ගත් තීරනය - යලිත් ගැනීමට සිදු වුවහොත් මා ගන්නා තීරනය - වූයේ, ඔහුට ජනසංහාරක අවි නිපදවීමේ කිසියම් හැකියාවක් තිබුනේ නම් අප ඔහු නතර කල යුතුය යන්නයි. එවකට මගේ මතය වූයේ එයයි. දැනුත් මගේ මතය එයයි."

බ්ලෙයාර් මතු කරන කරුන නම්, සැබවින්ම සදාම් සතුව සමූල ඝාතක අවි තිබූ බවක් හෝ ඒවා බ්‍රිතාන්‍යයට හෝ එහි සගයන්ට එරෙහිව යොදාගත් බවක් හෝ නොව, ඔහු අවි වැඩපිලිවෙලක් "ප්‍රතිස්ථාපනය" කිරීමේ "අනතුරක්" පමනක් තිබූ බවයි. ඒ වෙනුවට බ්ලෙයාර් කියා සිටින්නේ, අතීතයේදී කුර්දිවරුන්ට එරෙහිවත් ඉරාන යුද්ධයේදීත් ජන සංහාරක අවි භාවිතා කල බව සැලකිල්ලට ගත් කල ඉරාකය සතුව එවන් අවි තිබීමේ "සම්භාව්‍යතාව" පමනක් වුවත් යුද්ධය සුජාත කරන බවයි.

තවදුරටත් බ්‍රිතාන්‍ය, "සම්බාධක යොදාගැනීම තුලින් වලක්වාලීමේ පිලිවෙත" මත පිහිටා ක්‍රියා නොකලේ මන්දැයි බ්ලෙයාර්ගෙන් විමසූ විට ඔහු යලිත් ප්‍රතිරාවය කලේ, යුද්ධය සුජාත කිරීම සඳහා එක්සත් ජනපදය යොදාගත්, සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාර වලින් පසුව සියල්ල වෙනස්වී ඇතැයි යන තර්කයම ය. සිදුවියහැකි තවත් ප්‍රහාර පිලිබඳ "අවදානම ගැනීම" තවදුරටත් කල නොහැකි විය. 9/11 සිද්ධීන් වලට හෝ අල් කයිඩා සංවිධානය සමග සදාම් හුසේන්ගේ සම්බන්ධයක් නොතිබුනේය යන කාරනය පෙන්වා දුන් කල, ඔහු ඊට ප්‍රතිවිරුද්ධව කියා සිටියේ, ජනඝාතක අවි ගොඩගැසීමට "දඩබ්බර රාජ්‍යයන්ට" ඉඩදිය නොහැකිවූ බවත්, සදාම් හුසේන් හා අල් කයිඩා අතර සම්බන්ධය ගැන සැලකීමේදී අවධාරනය කල යුත්තේ, මර්දනකාරී හා අසාර්ථක රාජ්‍යයන් සිදුරු සහිත ඒවා වන බැවින් ඒ තුලින් රිංගා ගැනීමට ත්‍රස්ත කන්ඩායම් වලට වඩා පහසුවන බවත් ය.

සාරභූත ලෙසම බ්ලෙයාර් කියා සිටියේ, ජනඝාතක අවි හෝ ත්‍රස්ත ප්‍රහාර සම්බන්ධයෙන් ගත්කල සැබෑ තර්ජනයක්ම අවශ්‍ය නොවන අතර තර්ජනයක විභවය පමනක් සෑහෙන බවය.

ඉරාකයට එරෙහි යුද්ධය තුල පාලන තන්ත්‍රයේ වෙනසක් ඇති කිරීමේ අරමුනක් තිබුනු බවක් හා 2002 වසන්තයේදී තමන්, ජනාධිපති බුෂ් ක්‍රෝෆර්ඩ්හි පිහිටි ඔහුගේ ගොවිපලේදී හමුවූ අවස්ථාවෙහි, එවන් යුද්ධයකට එකඟවූ බවක් විධිමත් ලෙස පිලි නොගත්තේවී නමුත් එක්සත් ජනපදයේ පූර්වභංග යුද පිලිවෙතට බ්ලෙයාර් නිහඬ ලෙස යලි යලිත් සහාය පල කලේය. සදාම් ඉවත් කිරීමේ විකල්පය සැමවිට ම "ඔවුන් ඉදිරියේ තිබුනේ" යයි ඔහු පැවසීය. 9/11 සිද්ධිවලට පසුව පැතිර පැවති මතය නම්, "අපට තවදුරටත් පෙර පරිදි කටයුතු කල නොහැකි" බවයි.

1999 වන විට පාලන තන්ත්‍ර බලයෙන් පහකිරීම "යුක්තිසහගත අරමුනක් වී දැයි" නැගුනු ප්‍රශ්නයට පිලිතුර වූයේ, එසේ නොවූ බවයි. එහෙත් 1998 තරම් ඈත දී පවා ජනාධිපති බිල් ක්ලින්ටන් පාලන තන්ත්‍ර වෙනසකට පක්ෂව ඉදිරිපත්වී යයි ඔහු තවදුරටත් කියා සිටියේය. ජනඝාතක අවි තර්ජනය පිලිබඳව ක්‍රියා කිරීමට බ්‍රිතාන්‍යයට ද අවශ්‍යව තිබූ බවත්, එසේ කිරීමේ දී පාලන තන්ත්‍ර වෙනසක් කල යුතු වී නම් "එය එසේම සිදුවිය යුතු බවත්" ඔහු පැවසීය.

ප්‍රතිපත්තියක් වශයෙන් පාලන තන්ත්‍ර වෙනසක් ඇති කිරීම විවෘතවම අනුමත කලේය යන චෝදනාවෙන් ගැලවීම සඳහා බ්ලෙයාර් ගත් එකම උත්සාහය නම්, ප්‍රශ්නය මතු වූයේ ජනඝාතක අවි සම්බන්ධයෙන් බවත්, ඉරාකය කටයුතු කලේ එක්සත් ජාතීන්ගේ අංක 1441 දරන සම්මුතියට කෙලින්ම විරුද්ධව බවත් අවධාරනය කිරීමයි. යුද ප්‍රකාශ කිරීමට මෙම සම්මුතියෙන් බලය ලැබී තිබුනු බව ඔහු දිගින් දිගටම අවධාරනය කලේය. නිමක් දැකීමට තමන් කැමති පාලන තන්ත්‍රයන් බොහොමයක් ඇති නමුත්, ඒ පිලිබඳව ක්‍රියාත්මක විය හැක්කේ එක්සත් රාජධානියට එරෙහි ආරක්ෂක තර්ජනයක් පවතින්නේය යන පදනම මත පමනක් යයි ඔහු කියා සිටියේය. එක්සත් රාජධානියට එරෙහි එවැනි කිසිදු තර්ජනයක් සිදුවූ එකදු අවස්ථාවක්වත් පෙන්වා දීමට ඔහු අසමත් විය. එසේ නොමැතිව යුද්ධයක් කිරීමට පදනමක් නොතිබුනි. ඒ වෙනුවට සියලු සාක්ෂි වලට එරෙහිව ඉදිරිපත් වූයේ, සදාම් "සතුව නිසැකවම" ජනඝාතක අවි තිබුනු බවටත් නොඑසේ නම්, විකල්ප වශයෙන්, 2002 වසරේ බුද්ධි තොරතුරු ලේඛන ගොනුවට ඔහු සැපයූ කුප්‍රකට පෙරවදනෙහි සඳහන් කල පරිදි, ඉරාකය සතුව සමූලඝාතක අවි තිබූ බවට "කිසිදු සැකයක් නොතිබුනේ" යයි තමා "විශ්වාස කල" බවට ඔහු කරන ලද ප්‍රකාශයි.

ඉරාකය සතුව ජනඝාතක අවි නොතිබූ බවත්, හැන්ස් බ්ලික්ස් ඇතුලු අවි පරීක්ෂකවරුනට ඔවුන්ගේ කාර්යය නිම කිරීමට ඉඩ නොදුන් බවත් පෙන්වාදුන් කල බ්ලෙයාර්, යලි වතාවක් "විභවයක්" පිලිබඳ ප්‍රශ්නය කරා පල්ලම් බැසීය. "අවි වැඩපිලිවෙලක් යලි ඇරඹීමට" අවශ්‍ය ක්‍රමවේදයන් හා "ප්‍රායෝගික දැනුම" සදාම් සතුව තිබූ බව ඉරාක සමීක්ෂන කන්ඩායම සොයාගත් බවත්, යුද්ධයට යාම සුජාත කිරීමට එයම ප්‍රමානවත් බවත් ඔහු පැවසීය. ඇතැම් විට වැදගත් වන්නේ, "2003 මාර්තු මාසයේ" ප්‍රශ්නය ඇසීම නොව "2010 ප්‍රශ්නය" ඇසීම බව ඔහු කියා සිටියේය.

"2010 ප්‍රශ්නය" යන්නෙන් බ්ලෙයාර් අදහස් කරන්නේ "සදාම් නොමැති ලෝකයක් වඩා යහපත්" ද නැත් ද යන්නය. එය ඊට වඩා ගැඹුරු ප්‍රශ්නයකි. එහි අර්ථය වන්නේ, තමන් යෝග්‍ය යයි සලකන ඕනෑම අවස්ථාවක හා ඕනෑම ප්‍රදේශයක පාලන තන්ත්‍ර වෙනස් කිරීමේ අරමුන සහිතව ආක්‍රමනකාරී යුද්ධ දියත් කිරීමට ප්‍රධාන බලවතුන්ට විශේෂයෙන්ම එක්සත් ජනපදයට හා බ්‍රිතාන්‍යයට තර්කයක් ගොඩනැගීමයි. මෙය අනාගතයට ද වැදගත් වන්නේ යයි ඔහු පැවසීය. සදාම් හුසේන් යටතේ ඉරාකයේ මෙන්ම ඉරානය පිලිබඳව ද "ඒ හා බොහෝ සෙයින් සමාන වූ" ගැටලු පවතින බවත්, මේ තර්ජනයට එරෙහිව ක්‍රියාකිරීමේදී බ්‍රිතාන්‍ය දැන් "බෙහෙවින්ම යෝග්‍ය ස්ථානයක සිටින බවත්" ඔහු ප්‍රකාශ කරයි.

එක්සත් ජාතීන්ගේ අනුමැතිය හා එක්සත් ජාතීන්ගේ දෙවන යෝජනාවක් පිලිබඳ ප්‍රශ්නයේදී ඔහු එක එල්ලේ කියා සිටියේ, 2002 වසරේ සම්මත කල 1441 දරන යෝජනාවෙන් යුද්ධයට යුක්තිකරනය සැපයූ බවය. එහෙත් එක්සත් ජනපදය ඒකපාර්ශවීය ලෙස ක්‍රියාකිරීමට සෑමවිටම සූදානම්ව සිටි බව පිලිගැනීමට ඔහුට බල කෙරින. එක්සත් ජාතීන්ගේ දෙවන සම්මුතියක් ඇතිකිරීමේ ප්‍රයත්නය ඔහු විසින් ද අවසානයේ අතහැර දැමීය. මන් ද යත් එවන් සම්මුතියකට ප්‍රන්සය හා රුසියාව එකඟ නොවන බව "පැහැදිලිවම පෙනෙන්නට තිබුනු" බැවිනි. එවැනි යෝජනාවකට ආරක්ෂක මන්ඩලයේ බහුතරයකගේ සහාය ලබාගැනීමේ හැකියාව "සිඳී බිඳී" ගොසිනි. එක්සත් ජාතීන්ගේ මන්ඩලයෙන් තමන්ට අවැසි දේ කරවාගත නොහැකිවූ බැවින් බ්‍රිතාන්‍යය ද ඒක පාර්ශවීය ලෙස කටයුතු කල බව මින් පිලිගැනේ. එය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කිරීමකි.

බ්ලෙයාර්ට ඉතිරිව තිබුනේ අංක 1441 දරන සමමුතිය මත පදනම් වෙමින්, යුද්ධයට යාම සඳහා තමන් නීතිපති ගෝල්ඩ්ස්මිත්ගේ අනුමැතිය ලබාගෙන තිබුනේය යන කාරනයේ පිහිට පැතීමය. මෙය අවසාන මොහොතේදී ලබාගත් අනුමැතියක් ය යන කාරනය හා එක්සත් ජාතීන්ගේ බලය පැවරීමක් අලුතින් අවශ්‍ය වන බවට විදේශ කාර්යාලයේ නීතිඥ කන්ඩායම සැපයූ සංගත හා ඒකාබද්ධ උපදෙස් වලට "එරෙහිව යෑමක් ය" යන කාරනයත් ඔහු යලි යලිත් ඉවත දැමීය.

බ්ලෙයාර්ගේ සාක්ෂියටත්, විමර්ෂන කොමිසම මඟින් ඔහුට සැලකූ සැහැල්ලු ස්වභාවයටත්, යුද්ධය අරභයා ඔහුට පශ්චාත්තාප වීමට කිසිදු හේතුවක් නොමැති බවට අවසානයේදී ඔහු විසින් කරන ලද ප්‍රකාශයටත්, ඇතැම් ප්‍රේක්ෂකයන් ප්‍රතිචාර දැක්වූයේ "බොරුකාරයා" හා "මිනීමරුවා" යයි හඬ නැගීමෙනි. ඉරාකයේදී මරුමුවට පත්වූ ඇතැම් සෙබලුන්ගේ නෑදෑයන් එහි පැමින සිටි අතර එක් කාන්තාවක් හඬා වැලපුනාය.

චිල්කොට් විමර්ෂන කොමිසම හුදෙක් බල රහිත වූවා පමනක් නොව, ඔහුගේ කටයුතු වල සාපරාධී ස්වභාවය පිලිබඳව උඩින් පල්ලෙන් පමනක් සලකා බැලීමට එයට හොඳ හේතු සාධක පැවති බව බ්ලෙයාර් දැන සිටීම නිසා උද්ධච්ඡ ලෙස හැසිරීමට ඔහුට

පහසුවෙන්ම හැකියාව ලැබුනි. සියුම් ලෙස විමසා බැලිය යුතු කිසිදු ප්‍රශ්නයක් විනිශ්චය මන්ඩලය වෙතින් බ්ලෙයාර් වෙත යොමු නොකෙරුනු බව බොහෝ විචාරකයන් සටහන් කර තිබුනි. ඔහුගේ විශ්මිත හා සාපරාධී කිසිදු ප්‍රකාශයකට මොනම අවස්ථාවකදී වත් අභියෝගයක් එල්ල නොවීය. ඔහු පුරා පැය හයක් තිස්සේ දුන් සාක්ෂියෙන්, යුද්ධයේ නීත්‍යානුකූල භාවය පිලිබඳ සාකච්ඡාවට ගතවූයේ විනාඩි 35 ක් පමනි. ෆර්න් බ්‍රිට්න් සමඟ පසුගිය මාසයේ රූපවාහිනිය මඟින් කරන ලද සාකච්ඡාවට අවධානය යොමුකල ආකාරය සංකේතාත්මක විය. බ්‍රිට්න් ඇසුවේ මෙවන් ප්‍රශ්නයකි. "ජනඝාතක අවි නොතිබූ බව එවකට ඔබ දැන සිටියේ නම්, ඔබ තවදුරටත් එපරිද්දෙන්ම කටයුතු කරනු ඇත් ද?" "එසේ වුවත් තමා ඉරාකය ආක්‍රමනය කරනු ඇති බවත්, සදාම් හුසේන් ඉවත් කිරීම නිවැරදි යයි සලකනු ඇති බවත්, තර්ජනයේ ස්වභාවය පිලිබඳව වෙනත් තර්ක හා විධික්‍රම උපයෝගී කරගනු ඇති බවත්" බ්ලෙයාර් පිලිතුරු වශයෙන් කියා සිටියේය. තමා "පාලන තන්ත්‍ර වෙනසක්" යන වචන භාවිතා නොකල බවට අභියෝගයකින් තොරවම ප්‍රකාශ කිරීමට පරීක්ෂනය තුලින් බ්ලෙයාර්ට ඉඩ සලසා තිබුනි. "කිසිදු අයුරකින් ආස්ථානයෙහි වෙනසක් ඇති නොවීය. ආස්ථානය වූයේ ජනඝාතක අවි පිලිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කොට තිබීමයි. හේතුව එයයි. එවක දී මෙන්ම දැනුදු හේතුව එයයි."

අන් යමක් අපේක්ෂා නොකල හැකිව තිබුනි. ආන්ඩුව විසින් චිල්කොට් විමර්ෂන කොමිසම පිහිටුවනු ලැබුවේ ඉරාක යුද්ධය තුල බ්‍රිතාන්‍යයේ සහභාගිත්වය පිලිබඳව සැබෑ වගකීම භාරගැනීමෙන් බේරී යාමේ උපාය මාර්ගයක් වශයෙනි. 29 වන දින කාර්ය පටිපාටිය ආරම්භයේදීම විමර්ෂනයේ මූලාසනය දැරූ ජෝන් චිල්කොට් "මෙය නඩු විභාගයක් නොවේ" යයි රැස්ව සිටි අය වෙත දැනුම් දුන්නේය. සත්තකින්ම එය නඩු විභාගයක් නොවීය. එය සතුව නෛතික බලතල නොතිබුනා පමනක් නොව, එහි කාර්ය මන්ඩලය සමන්විත වන්නේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ විශ්වාසවන්ත නියෝජිතයන් වන ප්‍රිවි කවුන්සලයේ සාමාජිකයන්ගෙනි. මින් සමහරෙකුට ආන්ඩුව සමඟ සමීප සබඳතා ඇත.

ඉරාක යුද්ධයට නීති යුක්තභාවයක් ලබාදීම සඳහා 2004 වසරේ පිහිටුවන ලද රහස් තොරතුරු පිලිබඳ බට්ලර් විමර්ශන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් චිල්කොට් කටයුතු කලේය. පැරනි අන්තර්ජාල වාර්තා වලින් ලබාගත් "විශ්වාස කල නොහැකි ලේඛන ගොනුව" පිලිබඳව හෝ ඉරාකය සතුව, විනාඩි 45 ක් තුල බ්‍රිතාන්‍යයට එරෙහිව දියත්කල හැකි අවි තිබූ බව නිශ්චිතය වැනි ව්‍යාජ ප්‍රකාශ සම්බන්ධයෙන් බ්ලෙයාර් හෝ වෙනත් කිසිවෙකු වගකිව යුතුයයි පැවසීම බට්ලර් විමර්ෂන කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුනි. පාර්ලිමේන්තුව තුල මෙසේ කියා සිටීමට බ්ලෙයාර්ට ඉඩ සැලසුනේ එම වාර්තාව මඟින්ය. "කිසිවෙක් බොරු කීවේ නැත. කිසිවෙක් රහස් තොරතුරු ගෙතුවේ ද නැත. බුද්ධි අංශවල උපදෙස්වලට පටහැනිව ලේඛන ගොනුව තුලට කිසිවක් ඇතුල් කලේ ද නැත."

ලෝරන්ස් ෆ්‍රීඩ්මාන් බ්ලෙයාර්ගේ විදේශ ප්‍රතිපත්ති පිලිබඳ උපදේශකයෙකු විය. ඉරාක යුද්ධය සම්බන්ධයෙන් දැඩි මතධාරියෙකු ද විය. ඉතිහාසඥයෙකු වන මාටින් ගිල්බර්ට් තමන්ව හඳුන්වා ගත්තේ යුදෙව්වාදියෙකු වශයෙනි. ප්‍රිවි කවුන්සලයට පත්කල වසර තුලදීම ඔහු ජෝර්ජ් බුෂ් හා ටෝනි බ්ලෙයාර්, රූස්වෙල්ට් හා චර්චිල්ට සැසඳීම හේතු කොටගෙන චිල්කොට් විමර්ෂනයට ඔහුගේ පත්වීම පිලිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීන් සිව් දෙනෙකුගේ විවේචනයට ලක් විය. "ඊස්රායලයට පූර්න වශයෙන් කැපවීම" පිලිබඳව ඔහු මෑතකදී අගමැති ගෝර්ඩන් බ්‍රවුන්ට උනුසුම් ලෙස ප්‍රශංසා කලේය. රොඩ්රික් ලියන් රුසියානු ඒකාබද්ධ සංගමයේ බ්‍රිතාන්‍ය තානාපති වශයෙන් කටයුතු කලේය. ඔහු ජේපී මොර්ගන් චේස් බැංකුවේ උපදේශකයෙකි. එය ඉරාක වානිජ්‍ය බැංකුව මෙහෙයවන අතර ඛනිජතෙල් සංගතයක් වන බ්‍රිටිෂ් පෙට්රෝලියම් හි විශේෂ උපදේශකයෙකු ද වෙයි.

බලතල රහිත විමර්ෂනයකට මුහුනදීමට අමතරව, ලේ තැවරී ඇත්තේ තමන්ගේ දෑත්වල පමනක් නොවන බව බ්ලෙයාර් හොඳින් දැන සිටියි. ඔහුගේ සාක්ෂියේදී ගෝල්ඩ්ස්මිත් යුද්ධයට සහාය දැක්වූ බවත්, කැබිනට් මන්ඩලය හා කොන්සර්වේටිව් පාක්ෂිකයන් පමනක් නොව සමස්තයක් වශයෙන් පාර්ලිමේන්තුව ම ද යුද්ධයට සහාය දුන් බවත් හෙතෙම කියා සිටියේය. ඔහු යුද අපරාධකරුවෙකු ලෙස ප්‍රකාශ කරන්නේ නම් ඒ, බ්‍රිතාන්‍යයේ හා බුෂ් පාලන තන්ත්‍රයේ අනෙකුත් බොහෝ ප්‍රමුඛ පුද්ගලයන් ද සමඟය.

බ්ලෙයාර් හා ඔහුගේ අපරාධකාරී සගයනට යුක්තිය ඉටු කිරීමට නම්, චිල්කොට් විමර්ෂනය වැනි බොරු ප්‍රෝඩාවන් හා යුද්ධය නැවැත්වීමේ සංධානය වැනි සීමිත විරෝධතා මත විශ්වාසය නොතැබිය යුතුය. ඒ සඳහා ලෝකයේ ප්‍රධාන හා බලවත් ආන්ඩුවල යුද්ධයට අනුබල දෙන නායකයන්ට එරෙහිව බ්‍රිතාන්‍යයේ, එක්සත් ජනපදයේ හා ජාත්‍යන්තරව, කම්කරු පන්තියේ දේශපාලන මෙහෙයවීම අවශ්‍ය වේ.

© www.wsws.org